# මාක්ස්වාදී දර්ශනයට ප්‍රවේශයක්

අගුණකොලපැලැස්සේ විජයමෛත්‍රී හිමි

''මානුෂික වූ කිසිවක් මට අහිතකර නොවේ''

## හැඳින්වීම

බටහිර දර්ශනයේ ගෙවුණු වසර තුන්දහසක පමණ ඉතිහාසය තුළ ලෝකයට බලපෑමක් කළ චින්තකයින් අතලොස්ස අතුරින් කාල් මාක්ස්ට ප්‍රධාන තැනක් හිමිවේ. ඔහුගේ උපතින් වසර දෙසීයක් ඉක්ම වුව ද ඔහු සම්බන්ධ ජනතාව අතර සිදුවන සැමරීම් මෙන්ම දහස් ගණනක් ඉක්ම වූ ලිපි ලේඛන ඒ බවට සාක්ෂ්‍ය දරයි. ඒ හැරුණු කොට ලොව පුරා සිදුවන අරගල මාක්ස් ජීවමාන බව පෙන්වා දෙයි. ආර්ථිකය, දේශපාලනය, දර්ශනය, සමාජ විද්‍යාව, ඉතිහාසය මේ කුමක් ගැන සාකච්ඡා කළ ද එහි විප්ලවීය කොටස මාක්ස් වෙතින් පැන නැගීම කිසිසේත් බැහැර කිරීමට අපහසු බව එය වඩාත් ස්ඵුට කරයි. ඒ හැරත් දෙදහ දශකයේදී සිදු කළ සමීක්ෂණයකදී සහස්‍රයේ හොඳම චින්තකයා ලෙස මාකස් නම් කරනු ලැබීමත් දෙදහස් අට කාල පරාසය තුළ සිදුවූ ලෝක ආර්ථික අවපාතයේදී මාක්ස්ගේ දේශපාලන ආර්ථිකය ලොව පුරා ප්‍රධාන මාතෘකාව වූ අතර ධනවාදී චින්තකයින් පවා 'Das Capitals' ගැඹුරින් කියවා විසඳුම් සෙවීමට උත්සහ කරමින් මාක්ස්ව උපුටා දැක්වීම තුළින් ද පෙනෙන්නේ මාක්ස් මේ මොහොතට අනික් කවරදාටත් වඩා අදාළ බවයි. වලංගු බවයි. මෙම වියමන හුදෙක් කාල් මාක්ස් සහ ඔහුගේ දාර්ශනික සංකල්ප පිළිබඳව කෙරෙන ඉතා සංක්ෂිප්ත ප්‍රවේශයකි. එය එක් අතකින් ඉතා බැරෑරුම් වූවක් ද වෙයි. එයට හේතුව නම් කාල් මාක්ස් සහ ඔහුගේ දර්ශනය පිටු කිහිපයකින් පෙන්වා දීම එය අවතක්සේරු වීමකට හෝ විකෘති වීමකට යා හැකි බැවිනි. විශේෂයෙන්ම මාක්ස් සම්බන්ධ බොහෝ ලිපි ලේඛන ගත් කළ මාක්ස් නිවැරදිව කියවා ගැනීමක් හෝ වටහා ගැනීමක් නොකළ බවට පෙනෙන අවස්ථා නැතුවාම නොවේ. උදාහරණ ලෙස මාක්ස්, ආගම සම්බන්ධයෙන් ගෙනෙන විචාරය සඳහන් කළ හැකිය. එහෙයින් මෙම වියමනෙහි ප්‍රමුඛ අරමුණ

වන්නේ මාක්ස් කවුරුන් ද, ඔහුට අවශ්‍ය වූයේ කුමක් ද, ඔහුගේ දාර්ශනික ව්‍යාපෘතිය කුමන ස්වරූපයක් ගත්තේ ද යන ප්‍රශ්න කිහිපය සංක්ෂිප්තව විමසීමයි.

**සාකච්ඡාව**

1818 මැයි මස 05 වන දින ජර්මනියේ ට්‍රියර් නගරයේදී උපත ලැබූ මාක්ස් දාර්ශනිකයෙක්, ආර්ථික විද්‍යාඥයෙක්, ඉතිහාසඥයෙක්, දේශපාලන න්‍යායවරයෙක්, සමාජ විද්‍යාඥයෙක්, මාධ්‍යවේදියෙක් මෙන්ම විප්ලවීය සමාජවාදියෙක් ලෙස හඳුනා ගත හැකිය. ඔහුගේ චින්තනය මේ සියලු ක්ෂේත්‍රයන්හි කැපී පෙනෙන ලෙස විහිදී තිබීම හේතුවෙන් මාක්ස් එක් ක්ෂේත්‍රයකට පමණක් ලඝු කිරීම නුසුදුසුය. කෙසේ වුව ද කාල් මාක්ස්ගේ තරුණ අවධියේ සිටම ඔහුගේ අවසන් කාලය ද ඇතුළත්ව ජීවිතයේ වැඩි කොටසක් දේශපාලන ආර්ථිකය පිළිබඳව ලිවීමට වෙන්කළ බව පෙනේ. ඔහුගේ ආචාර්ය උපාධිය සඳහා ලියූ පර්යේෂණයෙන් පසුව සෘජුවම ඔහු දේශපාලන ආර්ථික න්‍යායන් විමර්ශනය කිරීමට පෙළඹී ඇත. 'Economic and Philosophical Manuscripts of 1844, A Contribution to the Critique of Political Economy' සහ විශේෂයෙන්ම මාක්ස්ගේ විශිෂ්ට කෘතිය ලෙස සැලකෙන 'Das Capitals' තුළ ද දැකිය හැක්කේ ඔහුගේ තරුණ සමයේ මතු වූ දේශපාලන ආර්ථික විවේචනයන්ගේ ගැඹුරු දිගුවකි.

මාක්ස්ගේ දැක්ම සංයුක්ත කරවන කාරණාවන් ද්විත්වයක් එවකට එංගලන්තයේ සහ ජර්මනියේ ප්‍රකටව පැවතුනු 'පාපොච්ඡාරණ' (Andy Blunden, 1956) නම් ප්‍රශ්නමාලාවට මාක්ස් ලබා දෙන පිළිතුරු අතරින් සොයාගත හැකිය. එහිදී මාක්ස් තමන්ගේ ප්‍රියතම ආප්තෝපදේශය ලෙස නම් කරන්නේ ''මානුෂික වූ කිසිවක් මට අහිතකර නොවේ'' යන්නයි. එසේම ඔහුගේ ප්‍රියතම ආදර්ශ පාඨය 'සියල්ල සැක කරනු' යන්න සඳහන් කරයි. මතු පිටින් මේ දෙකෙහි පරස්පර බවක් පෙන්නුම් කළ ද එහි ගැඹුරු අරුත පෙන්වා දෙන්නේ මාක්ස් තුළ තිබූ සමාජය පිළිබඳ වූ දැඩි වගකීම් සහගත භාවය සහ මනුෂ්‍ය සංහතිය කෙරෙහි අනුරාගයත්, තර්ක බුද්ධිය සහ නූතනවාදයේ මහා බුද්ධි ප්‍රබෝධයයි. මෙය තව දුරටත් ප්‍රකට වන්නේ එම ප්‍රශ්න මාලාවේම වඩාත් ප්‍රියකරන වීරයන් විමසූ විට මාක්ස් නම් කරන

'ස්පාටකස්' සහ 'කෙප්ලර්' යන පිළිතුරු මඟිනි. මෙහිදී ස්පාටකස් යනුවෙන් සඳහන් වන්නේ රෝම අධිරාජ්‍යයට විරුද්ධව වහල් මිනිසුන් මුදාගත් රණකාමියෙකි. ඔහු ඉතිහාසයේ නම් දරන්නේ පීඩිතයන්ගේ නිදහස උදෙසා සටන් කළ වීරයෙකු ලෙසයි. එහෙයින් ස්පාටකස් මානව වර්ගයාට විමුක්තිය අත්පත් කරදීම වෙනුවෙන් කැමැත්තෙන්ම වධ වේදනාවන්වලට ගොදුරු වීමේ අනුරාගය පිළිබඳ සංකේතයකි. එසේම ජොහැන්ස් කෙප්ලර් 17 වැනි සියවසේ විද්‍යාත්මක විප්ලවයේ ප්‍රමුඛයෙකු මෙන්ම තාරකා විද්‍යාව සහ ගණිතය එකට සම්බන්ධ කළ විද්‍යාඥයාය. ලෝකය වටහාගත හැකි පද්ධතියකට අනුව චලිත වන බව පැවසීමත් ගුරුත්වාකර්ෂණ න්‍යාය සොයා ගැනීම සහ වර්තන දුරේක්ෂය නිර්මාණයට මූලික පසුබිම සැකසීමත් ඔහු අතින් සිදුවීම තුළින් තර්ක බුද්ධිය සහ ඥාන ගවේෂණය පිළිබඳ ඉතිහාසය මත මුද්‍රාවක් තැබූ අයෙකු ලෙස කෙප්ලර් සළකනු ලබයි. ඒ අනුව මාක්ස් ප්‍රිය කරන වීරයන් දෙදෙනා ද අනුරාගය සහ තර්ක බුද්ධිය සංකේතවත් කරයි.

මානව වර්ගයාගේ විමුක්තිය වෙනුවෙන් අනුරාගික මැදිහත් වීමක් මාක්ස්ගේ මුලු ජීවිතය කෙරෙන් දැකිය හැකිය. සිය ජීවිතයේ යොවුන් වියේ දී, වයස අවුරුදු 17 දී වෘත්තියක් තෝරා ගැනීම පිළිබඳ 'තරුණයෙකුගේ ප්‍රත්‍යවේක්ෂණයන්' නම් ලිපියේ මාක්ස් සඳහන් කරන සමහරක් දෑ මෙලෙස උපුටා දැක්විය හැකිය.

''කෙසේ වුවද වෘත්තියක් තෝරා ගැනීමේදී අපට මඟ පෙන්විය යුතු ප්‍රධාන මූල ධර්මය නම් මනුෂ්‍ය සංහතියේ සුභ සිද්ධිය සහ අපගේම පරිසමාප්තියයි. මෙම උත්සුඛයන් දෙක එකිනෙක සමඟ ගැටෙන බව හෝ එකක් අනෙක වනසා දැමිය යුතු බව හෝ නොසිතිය යුතුය. ඊට ප්‍රතිපක්ෂව තම සමාජයේ පරිසමාප්තිය සහ සුභ සිද්ධිය උදෙසා කටයුතු කිරීම මඟින් පමණක්ම තමන්ගේම පරිසමාප්තිය සාධනය කරගත හැකිවන පරිදි මිනිසාගේ ස්වභාවය සැකසී ඇත...

තමන් උදෙසා පමණක් පුද්ගලයකු කටයුතු කරයි නම්, ඔහුට ඇතැම් විට ප්‍රකට ශාස්ත්‍රඥයකු, මහා ප්‍රාඥයකු හෝ කැපී පෙනෙන කවියකු විය හැකිය. එහෙත් පරිපූර්ණ සහ සැබැවින්ම ශ්‍රේෂ්ඨ මිනිසෙකු වීමට නම් ඔහුට නොහැකිය''

''එවිට අප කිසිඳු පටු, සීමිත, ආත්මාර්ථකාමී සතුටක් අත් නොවිඳිනු ඇත. අපගේ සතුට ලක්ෂ සංඛ්‍යාත ජනකායකට අයත් වනු ඇත. අපගේ ක්‍රියාවන් නිහඬ වුවද සදාකාලිකවම පවතිනු ඇත. අපගේ භෂ්මාවශේෂ මත උතුම් මිනිසුන්ගේ උණු කඳුළු වැගිරෙනු ඇත.'' (කාල් මාක්ස්: ඔහු කවුද, අපි කවුද, 2018, 7-9)

මාක්ස් සිය ජීවිතයේ අවසානය දක්වාම ඉහත සඳහන් කළ අදහස් තුළම සිටි බවට ඔහුගේ ජීවිත අත්දැකීම් මනාව පෙන්වා දෙයි. යුරෝපා විප්ලවවලදී ඔහු පෞද්ගලිකවම ඒවාට සම්බන්ධ වූ අතර එම නිසා රාජ්‍ය මර්ධනයට, අත්අඩංගුවට ගැනීමට සහ පිටුවහල් කරනු ලැබීමට ගොදුරු විය. බොහෝ අවස්ථාවල ඔහු පීඩාවට පත් පංතිය වෙනුවෙන් තම ජීවිතය අවදානමට හෙලාගත් බව ඔහු විසින්ම ලියන ලද ඇතැම් ලිපි මගින් දැකගත හැකිය. 1867 අප්‍රේල් 30 වැනිදා නිව්යෝක්හි සිග්ප්‍රිඩ් මේයර් වෙත යැවෙන ලිපිය මේ සඳහා උදාහරණ වේ.

''මම ඔබට පිළිතුරු සැපවූයේ නැත්තේ ඇයි? ඒ මම මරණයේ දොරකඩ සිටි බැවිනි. එමෙන්ම මගේ සෞඛ්‍යය, ප්‍රීතිය සහ පවුල කැප කරමින් ලියන මේ පොත (ප්‍රාග්ධනය) ලිවීම වෙනුවෙන් මට සෑම නිමේෂයකින්ම පාහේ ප්‍රයෝජනයක් ගත යුතු බැවිනි'' (MECW Volume 42, 1934, 366)

මේ හැරුණු කොට මාක්ස්ගේ මුලු ජීවිත කාලය පුරා මානව විමුක්තිය සඳහා අත්‍යවශ්‍ය එතෙක් සමාජය සතුව පැවතුණු දැනුමේ සීමාකම් අතික්‍රමණය කරන මහා බුද්ධි ව්‍යායාමයක් ඇති කිරීමට උත්සහ ගෙන ඇත. වයස අවුරුදු දහනවයේදී සිය පියාට යවන ලිපියේදී ද මාක්ස් සඳහන් කරන්නේ පවතින දෙය සහ ගොඩ නැගිය යුතු දෙය අතර පරතරය විද්‍යාවකින් පියවීම සඳහා තමා උත්සහ ගන්නා බවයි.

''සෑම සත්‍යක්ම බොඳ වී යාමටත්, ඒවායේ සීමිත බව නැතිව යාමටත් පටන්ගත්තේය. මම වර්තමානයට පහර ගැසුවෙමි. පාලනයකින් හෝ ආකෘතියකින් තොරව හැඟීම් ප්‍රකාශ කළෙමි. කිසිවක් ස්වාභාවික නොවූ අතර හැමදෙයක්ම සඳ එළියෙන් සැදුනාක් මෙන් විය. පවතිනුයේ කුමක්ද (What is) සහ පැවතිය යුත්තේ කුමක්ද

(What ought to be) යන දෙක අතර පූර්ණ ප්‍රතිවිරොධයක් ඇතැයි මම විස්වාස කළෙමි. (Paul M. Schafer, 1897)

ෆොයර්බාහ් තීසීසයන්ගේ එන තුන්වන, අටවන සහ එකොළොස්වන ප්‍රවාදයන් මඟින් ද මාක්ස් තහවුරු කරන්නේ මෙම උත්සාහයයි. විශේෂයෙන්ම 1841 දී ජෙනා විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ලබා ගැනීමට ලියූ '' සොබා දහම පිළිබඳ ඩිමොක්‍රටීස්ගේ සහ එපිකියුරස්ගේ දර්ශනවාදයන්ගේ වෙනස නම් නිබන්ධයේ ද මාක්ස් උත්සාහ ගන්නේ දර්ශනයේ ඇති අති මූලික ගැටලුවක් වන පවතින දෙය සහ අපේ බුද්ධිමය චින්තනය අතර ස්වභාවය සහ වෙනස පිළිබඳ පැහැදිලි කර ගැනීමටයි. එතුළින් ඔහු හේගල්ගේ දර්ශනය අධ්‍යයනයට පෙළඹුණු අතර පසුව මාක්ස් හේගල්ව ඉක්මවා යමින් විප්ලවීය ලෙස නව දාර්ශනික මානයන් බිහි කිරීමට ද සමත් විය.

ඒ අනුව ක්‍රිස්තු පූර්ව පස්වන සියවසේ පමණ පටන්ම ග්‍රීසීය, ඉන්දියාව හා චීනය මූලික කරගෙන ආරම්භ වී වර්තමානය දක්වා වර්ධනය වූ දාර්ශනික එළඹුම් දක්වා වන අති විශාල පරාසය තුළ මාක්ස් ස්ථාන ගත වන්නේ මානව චින්තනය සහ භෞතික ලෝකය අතර ඇති සම්බන්ධය මෙන්ම ස්වභාවය විග්‍රහ කිරීමට එහා ගිය 'වෙනස් කිරීම' (Praxis) තුළින් බව මුලින්ම දුටු මිනිසා ලෙසයි. දර්ශනය තුළ මතුවන ප්‍රශ්න සහ එහි ප්‍රතිවිරෝධතා දර්ශනය තුළම විසදිය නොහැකි බව මාක්ස්ගේ මූලික පදනම විය. දර්ශන ඉතිහාසය තුළ හේගල් දක්වාම දාර්ශනික ප්‍රශ්න දර්ශනය තුළම විසඳීමේ උපරිම ලක්ෂයය දක්වා ගමන් කර තිබීම දැකිය හැකිය. හේගල් වෙතින් පැන නැගුණු පරම විඥානවාදී අදහස් එහි උපරිමය ලෙස සටහන්ව තිබුණි. මේ හේතුවෙන් මාක්ස් පුළුල් ලෙස විශ්වාස කළ දෙය නම් න්‍යාය සහ භාවිතය අතර පරතරය ජය ගත හැකි වන්නේ හුදු න්‍යායයෙන් හෝ ඉදිරි දැක්මකින් නොව යථාර්ථය තුළ ජය ගැනීමේ සටනකින්ම පමණක් බවයි. එම නිසා ඔහු ලෝකය විග්‍රහ කිරීමේ දාර්ශනික මූල ධර්මය ලෝකය වෙනස් කිරීමේ ප්‍රයුක්තියක් වෙත වර්ධනය කළේය. 'මෙතෙක් කල් දාර්ශනිකයන් කළේ විවිධාකාරයෙන් ලෝකය විග්‍රහ කිරීමයි, නමුත් කළ යුත්තේ එය වෙනස් කිරීමයි' යනුවෙන් එක් ප්‍රවාදයක් හරහා මාක්ස් එතෙක් පැවති සමස්ත දර්ශනවාදය නව මානයක් කරා එස වූයේය. එපමණක් නොව එතෙක් දර්ශනවාදය

පැටලී සිටි චින්තනයට වාස්තවික සත්‍යය අවබෝධ කරගත හැකි ද යන ප්‍රශ්නය දර්ශනයේ ප්‍රශ්නයක් නොව, ජීවන ව්‍යවහාරයේ ප්‍රශ්නයක් ලෙස මාක්ස් සම්පූර්ණ ප්‍රශ්නයම විප්ලවීය ලෙස කණපිට හැරවූවේය.

''මිනිස් චින්තනයට වාස්තවික සත්‍යය අවබෝධ කරගත හැකිද යන ප්‍රශ්නය න්‍යායික ප්‍රශ්නයක් නොව ව්‍යවහාරික ප්‍රශ්නකි. මිනිසා විසින් සත්‍යය, චින්තනයේ මෙම පාර්ශවය තහවුරු කළ යුතු වන්නේ ව්‍යවහාරය තුළය. එනම් ව්‍යවහාරයෙන් හුදෙකලාව චින්තනයේ යථාර්ථවත් බව හෝ නො-යථාර්ථවත් බව පිළිබඳ විවාදය තනිකරම පණ්ඩිතමානී ගැටළුවකි.'' (කාල් මාක්ස්: ඔහු කවුද? අපි කවුද?, 2018, 17)

මේ අනුව දෙයක් 'දැනගැනීම' විවාදය එම දෙය 'වෙනස් කිරීම' සහ ඊට අදාළ නිශ්ක්‍රියාකාරීත්වය සමඟ බැඳී පවතින බව මාක්ස් පෙන්වා දුන්නේය. ඒ අනුව, යමක් දැනගැනීම තව දුරටත් හුදු පරිකල්පනයේම ප්‍රශ්නයක් නොවන බවත් ප්‍රතිපක්ෂයන්වල අන්තර් සම්බන්ධිත ක්‍රියාකාරිත්වයන් ලෝකයට ඇති සම්බන්ධය සහ එම සම්බන්ධය යම් නිශ්චිත නිෂ්පාදන සම්බන්ධතා, සමාජමය ව්‍යුහයන් සහ වෙනත් භෞතික කොන්දේසි මත නිර්මිතයන් ලෙසය. මෙහිදී මාක්ස් මිනිසාත් ලෝකයත් අතර සම්බන්ධය 'ශ්‍රමය' මඟින් විග්‍රහ කිරීම තුළින් පෙන්වා දෙන්නේ අපගේ විඥානයේ ගති ස්වභාවයන් නිරීක්ෂණය කළ යුත්තේ හුදු විඥානය ඇතුළතින්ම නොව අපගේ ද්‍රව්‍යමය ජීවිතයත් සමඟය. එනම්, ශ්‍රමය හා නිෂ්පාදන සම්බන්ධතා සමඟය. ඒ අනුව, එතෙක් හේගල් විසින් ඔසවා තැබූ සියල්ල පරම විඥානයක ප්‍රකාශිතයන්ය යන්න ප්‍රතික්ෂේප කරමින් මාක්ස් 'ජර්මන් දෘෂ්ටිවාදය' නම් කෘතියේදී පවසන්නේ, විඥානය විසින් ජීවිතය නිර්ණය කරනවා නොව, ඊට පරස්පරව ජීවිතය විසින් විඥානය නිර්ණය කරන බවයි. එය සරලව පවසන්නේ නම් අප සිතන්නේ කුමක්ද යන්න තීරණය කෙරෙන්නේ අප කරමින් සිටින දෙය මඟිනි. එනිසා සමාජ විඥානය විසින් සමාජ සත්තාව තීරණය කරනවා නොව සමාජ සත්තාව මඟින් සමාජ විඥානය තීරණය කිරීමයි.

''මම එළැඹුණු හා ඒ තුළ මාගේ අධ්‍යයනයන්ගේ මාර්ගෝපදේශයේ මූලධර්මය බවට පත් වූ පොදු නිගමනය මෙලෙස සාරාංශ ගත කළ හැකිය.

සිය පැවැත්ම සඳහා වන සමාජමය නිෂ්පාදනයේදී, මිනිස්සු අනිවාර්ය ලෙසම සිය කැමැත්තෙන් ස්වාධීනව පවතින ස්ථිර සබඳතාවන්ට, එනම් ඔවුන්ගේ ද්‍රව්‍යමය නිෂ්පාදනයේ බලවේගයන්ගේ සංවර්ධනය නිශ්චිත අවධියකට අනුරූපවන නිෂ්පාදන සම්බන්ධතාවලට ඇතුළු වෙති. මෙම නිෂ්පාදන සබඳතාවන්ගේ සමස්තය නෛතික හා දේශපාලන උපරි ව්‍යුහයක් ද, ඊට අනුරූප සමාජ විඥානයේ නිශ්චිත ආකෘතීන්ට උපත ලබා දෙන සමාජයේ ආර්ථික ව්‍යුහය, එහි සැබෑ පදනම නිර්මාණය කරයි. ද්‍රව්‍යමය ජීවිතයේ නිෂ්පාදන මාදිලිය සමාජ, දේශපාලන හා බුද්ධිමය ජීවිතයේ පොදු ක්‍රියාවලිය සකස් කරයි. මිනිසුන්ගේ පැවැත්ම නිර්ණය කරන්නේ ඔවුන්ගේ විඥානය විසින් නොවේ. නමුත් ඔවුන්ගේ විඥානය තීරණය කරන්නේ ඔවුන්ගේ සමාජ පැවැත්ම විසිනි.'' (Balibar,1993, 45).

සැබැවින්ම ඉහත උපුටනය මාක්ස්ගේ දර්ශනය කැටිකොට දැක්වීමක් ලෙසද දැක්විය හැකිය. මාක්ස්ගේ දාර්ශනික චින්තනය තුළ දිවෙන භෞතිකවාදී පදනම එමඟින් වඩා ගම්‍ය කෙරේ. මාක්ස්ට පෙර යම්තාක් දුරට භෞතිකවාදී පදනමක් ගෙන සිටියේ ෆොයර්බාග් විසිනි. ඔහු පැවසූ පරිදි මිනිසා යනු ඉන්ද්‍රියගෝචර සංවේදනා ඇති සත්ත්වයකි. එසේම තත්ත්වයන් විසින් මිනිසුන් නිර්මාණය කරන බව ද ඔහු පැවසීය. මෙහිදී මාක්ස්ගේ විවේචනය වන්නේ ෆොයර්බාග් (Feuerbach) පැවසූ පරිදි මිනිසා යනු ඉන්ද්‍රියගෝචර සංවේදනා ඇති සත්ත්වයකු පමණක් නොව ඉන්ද්‍රිය මූලික ක්‍රියාකාරිත්වයක් ඇති සත්ත්වයකු බවයි. ලෝකය, අපගේ ඉන්ද්‍රියන්, ඒවායේ සංවේදනා සහ ඒ පිළිබඳ අපගේ චින්තනය පවා ඓතිහාසික බවත් එය නිෂ්පාදනීය ක්‍රියාකාරීත්වය සමඟ සම්බන්ධ බවත්ය.

තරුණ අවධියේදී, මාක්ස් රට අතහැර ප්‍රංශයේ, ලන්ඩනයේ, එංගලන්තයේ සිය ජීවිතයේ වැඩි කාලයක් ගත කළ අතර එහිදී ඔහු ජර්මානු චින්තකයෙකු වන ෆ්‍රෙඩ්රික් එංගල්ස් සමඟ සහයෝගයෙන් තම චින්තනය වර්ධනය කර ගනිමින් විවිධ ග්‍රන්ථ ප්‍රකාශයට පත් කළේය.

ඔහුගේ පෙර ලියවිලි, එක් අතකින්, හේගලියානු දර්ශනය කෙරෙහි රැඩිකල් ප්‍රතිචාරයක් වන අතර විශේෂයෙන් තරුණ හේගලියානුවන් වෙත දක්වන ප්‍රතිචාර ලෙස සැලකිය හැකිය. මාක්ස්ගේ දර්ශනය හේගල් දර්ශනයේ අඛණ්ඩ පැවැත්මක් බවත් එහි මූලික සංකල්ප මතු වී ඇත්තේ හේගල්ගෙන් බවත් චින්තකයින් අතර මතභේදයක් පවතී. වෙනත් වචන වලින් පවසන්නේ නම්, මාක්ස්ගේ ක්‍රමවේදය සැබවින්ම පදනම් වී ඇත්තේ හේගල් විසින් භාවිත කරන ලද ක්‍රමවේදය මත බව ඔවුහු පවසති. හේගලියානු මාක්ස්වාදීන්, ජෝර්ජ් ලූකාක්ස්, (History and Class Consciousness) විශේෂයෙන්ම සිඩ්නි හුක් (From Hegel to Marx: Studies in the Intellectual Development), ඇල්ෆ්‍රඩ් ෂ්මිට් (History and Structure) වැනි චින්තකයින් හේගල්ගේ 'Science of Logic and Phenomenology of Spirit' ගැඹුරින් කියවීමෙන් පසු මෙම අදහස දැරීය. ඔවුන්ට පෙර, ලෙනින් ද්‍රව්‍යවාදී හේගල් උපකල්පනය කළ අතර ඔහුගේ Philosophical Notebook (1914) පොතේ කියා සිටියේ දාස් කැපිටල්ස් කියවීමට පෙර හේගල්ගේ 'විද්‍යාවේ තර්කනය' කියවිය යුතු බවයි. කෙසේ වෙතත්, මෙයට ප්‍රතිවිරුද්ධව, ද්‍රව්‍යමය තත්ත්වයන් විඥානය හැඩගස්වන බව පවසමින් විඥානවාදී අපෝහකය භෞතිකවාදී එකක් බවට පත් කිරීමෙන් මාක්ස් හිස මතින් සිටි හේගල් දෙපයින් සිට වූයේ යයි සමහරු තර්ක කරති.

මේ කාරණය සම්බන්ධයෙන් වෙනස් අදහසක් දරන මාක්ස්වාදී චින්තකයෙකු වන ලුවී අල්තුසර්, මාක්ස් ස්පිනෝසාගේ බලපෑමට ලක් වී ඇති බව දක්වමින් ඔහු මාක්ස් සහ හේගල් අතර පැහැදිලි රේඛාවක් (ඥානවිභාගාත්මක ඛණ්ඩණයක්) අඳියි. විශේෂයෙන්ම ඔහු 1845 ට පෙර මාක්ස්ගේ අදහස් මතවාදී කාල පරිච්ඡේදය වශයෙනුත් එයින් පසු කාලය විද්‍යාත්මක කාල පරිච්ඡේදය වශයෙනුත් බෙදා දක්වයි. මාක්ස්වාදියෙකු ලෙස, අල්තුසර් හේගලියානුවාදය සහ පැවැත්මවාදය යන දෙකටම විරුද්ධ වේ (Man that Night and The Return to Hegel). එසේම හේගල්ගේ ඓතිහාසිකවාදය, සමස්තය, සාරය සහ ආත්මීයවාදය ඔහු විවේචනය කරයි. ඔහුගේ 'Essays of Self-Criticismී යන්නෙහි දක්වන පරිදි මාක්ස්වාදී දර්ශනය සම්භවය, සාරය සහ හේතුව ලෙස විෂයයේ විඥානවාදී කාණ්ඩයෙන් බිඳී යන අතර මාක්ස්වාදී දර්ශනය සඳහා නිරපේක්ෂ කේන්ද්‍රයක් ලෙස විෂයයක් තිබිය නොහැකි ය. එහෙයින් හේගලියානු භෞතිකවාදී ප්‍රවේශය

වෙනුවට අල්තුසර් විසින් මාක්ස් ස්පිනෝසාගේ දාර්ශනික අංග වෙත තල්ලු කරන ලදී. ඔහු 'Reading Capital' හි මෙසේ දක්වයි.

'ස්පිනෝසාගේ දර්ශනය දර්ශන ඉතිහාසයේ පෙර නොවූ විරූ ඓතිහාසික විප්ලවයක් හඳුන්වා දුන්නේය, බොහෝ විට සර්වකාලීන විශිෂ්ටතම දාර්ශනික විප්ලවය, ඒ නිසා අපට දාර්ශනික ස්ථාවරයේ සිට මාක්ස්ගේ එකම සෘජු මුතුන්මිත්තෙකු ලෙස ස්පිනෝසා සැලකිය හැකි ය.'

මෙම තර්ක විවිධ වුවද ඔවුන් මාක්ස්ගේ ප්‍රධාන දාර්ශනික අදහස් නිශ්චිත ආකාරයකින් වටහාගෙන ඇති බව පැහැදිලිය. සාමාන්‍යයෙන්, මාක්ස් සහ එංගල්ස් දෙදෙනා විසින්ම ජනනය කරන ලද සමාජය, ආර්ථිකය සහ දේශපාලනය පිළිබඳ විවේචනාත්මක න්‍යායන් සාමූහිකව මාක්ස්වාදය ලෙස සැලකේ. ඔවුන්ගේ වඩාත් ප්‍රසිද්ධ කෘතීන් වන්නේ; 'කොමියුනිස්ට් ප්‍රකාශනය'(Communist Manifesto) (මෙය මාක්ස්වාදයේ බයිබලය ලෙස සැලකේ), 'ජර්මානු දෘෂ්ටිවාදය' (German Ideology) සහ ලෝක බුද්ධිමය, ආර්ථික හා දේශපාලන ඉතිහාසයට බලපෑ 'ප්‍රාග්ධනය' (Das Capital) දැක්විය හැකි ය. අනෙකුත් වැදගත් කෘති වන්නේ; On James Mill, Economic and Philosophical Manuscripts of 1844, Feuerbach Theses, The Holy Family, Poverty of Philosophy, Grundrisse, A Contribution to the Critique of Political Economy, The Class Struggle in France සහ ලේඛන සියයකට වඩා ඔවුන් අතින් ලියවී ඇති බව කියැ වේ. මෙම ලේඛන සම්බන්ධයෙන්, මාක්ස්වාදය බොහෝ දුරට හේගල්ගේ අපෝහකය, ප්‍රංශ මනෝරාජික සමාජවාදය සහ ඉංග්‍රීසි ආර්ථික විද්‍යාව මත පදනම් වී ඇති බවද පැවසිය හැකිය. ඇතැම් චින්තකයින් මාක්ස්ගේ දාර්ශනික අදහස් ඔහුව තරුණ හා පරිණත වශයෙන් වෙන් කරමින් හඳුනා ගෙන ඇත. තරුණ මාක්ස් ඉතා රැඩිකල් වූ අතර දේශපාලන ආර්ථික ක්ෂේත්‍රය කෙරෙහි වඩාත් උනන්දුවක් දක්වා තිබේ. එහිදී ඔහු ඇඩම් ස්මිත්ගේ 'Wealth of Nation' මෙන්ම වෙනත් ආර්ථික ග්‍රන්ථ හදාරා ස්වකීය අදහස් ස්ථාපනය කර ඇත. ඔහු 1844 දී ලියූ ආර්ථික හා දාර්ශනික අත්පිටපත් ඔහුගේ පසුකාලීන ලේඛන සඳහා මුල් වී ඇති අතර එයින් අදහස් කරන්නේ ඔහුගේ වඩාත්ම තීරණාත්මක කෘතිය වන ප්‍රාග්ධනය සැබවින්ම දේශපාලන

ආර්ථික විද්‍යාව පිළිබඳ ඔහුගේ මුල් අදහස්වල අඛණ්ඩ පැවැත්මක් බවයි. සමස්තයක් ලෙස ගත් කල මාක්ස්ගේ සහ එංගල්ස්ගේ දාර්ශනික ව්‍යාපෘතියේ ප්‍රධාන සංකල්ප කිහිපයක් හඳුනා ගත හැකිය. ඓතිහාසික භෞතිකවාදය, ආර්ථික පදනම සහ උපරි ව්‍යුහය, පරාරෝපණය, මානවවේදය, සෞන්දර්යවේදය, ආගම සහ සමාජය පිළිබඳ විවේචන ඒ අතර වේ.

ඓතිහාසික භෞතිකවාදය යනු සමාජ ඉතිහාසය පිළිබඳ මාක්ස්ගේ භෞතිකවාදී විග්‍රහයයි. එහි සරල අදහස වන්නේ සෑම සමාජ සමාජ ඉතිහාසයක්ම එහි භෞතිකවාදී පදනම මත ගොඩනැගී ඇති බවයි. එනම්, ඉතිහාසයේ චලිතයේ ගාමක බලවේගය ලෙස එය ගමන් කරන බවයි. එංගල්ස් සහ ලෙනින් එය අපෝහක භෞතිකවාදය ලෙසද හඳුන්වා ඇත. මාක්ස් මෙම විධික්‍රමය ( අපෝහක දයලෙක්තිකය) හේගල්ගෙන් උකහා ගත්තද ඔහු පැවසුවේ හේගල් පැවසුවාක් මෙන් මිනිස් ඉතිහාසය යනු අදහස් වල ඉතිහාසයක් නොව භෞතික ඉතිහාසයක් බවයි. එම භෞතිකය කුමක්ද? මාක්ස් මේ සඳහා ප්‍රවේශ වන්නේ මුළු මහත් ඉතිහාසය පුරාම මිනිසා විසින් සිය ජීවිතය රැක ගැනීමට මෙන්ම  පවත්වා ගැනීමට අවශ්‍ය දෙය ලෙස වර්ධනය කරන ලද නිෂ්පාදනය (Productivity) වෙතිනි. එය 'කන', 'බොන' වශයෙන් හුදු අවශ්‍යතාවයකට ලඝු කිරීමට නොහැකිය. නිෂ්පාදනය සියලු අවශ්‍යතාවල පදනම ලෙස ක්‍රියාත්මක වේ. ඒ අනුව ඇත්තෙන්ම මාක්ස් අතින් සිදුවූයේ හේගල්ගේ ඉතිහාසය අදහස්වල විකාශනය සහ කාර්යභාරය ප්‍රතික්ෂේප කිරීමට වඩා එම අදහස්වල භෞතික කේන්ද්‍ර සහ භෞතික කාර්යභාරය පැහැදිලි කිරීමය. හේගල් Phenomenology of Spirit හි දක්වන අදහස්වල අන්‍යෝන්‍ය ප්‍රතිවිරෝධය සහ පරමාත්මයේ  ක්‍රියාකාරිත්වයේ අදහස මාක්ස් දුටුවේ අනවශ්‍ය ගුප්තභාවයක් ලෙසය. ඒ වෙනුවට භෞතික ක්‍රියාවන් ලෝකය සම්පූර්ණයෙන්ම හැඩගස්වන බව ඔහු ප්‍රකාශ කළේය. එංගල්ස් ජෝසප් වෙත යවන ලිපිය මගින් මේ පිළිබඳ පැහැදිලි කිරීමක් කර ඇත.

මාක්ස්වාදී දර්ශනය හැදෑරීමේදී අපට මුණගැසෙන ඓතිහාසික භෞතිකවාදය යන ක්ෂේත්‍රය  එයින් සාකච්ඡා කරන දේවල් අනාවරණය කරන විට 'German Idealogy' කෘතිය අතිශය

වැදගත් වේ. ඉතිහාසය පිළිබඳව භෞතිකවාදී සංකල්පය පිළිබඳ මූලික අදහස් ලබාගත හැක්කේ මෙම කෘතියෙනි. මෙම භෞතිකවාදී දැක්ම මගින් කියවෙන්නේ සමාජයක් විශ්ලේෂණය කිරීමේදී අපි පදනම් විය යුත්තේ එම සමාජයේ සාමාජිකයන් නිෂ්පාදනය කරන්නේ කොහොමද යන්නත් ඔවුන්ගේ අවශ්‍යතා තෘප්තිමත් කරන්නේ කෙසේද යන්නත් පදනම් කරගෙන බවයි. ඕනෑම සමාජයක ඉතිහාසය හැදෑරීමේදී පූර්ණ කොන්දේසිය වශයෙන් සැලකිය යුත්තේ මෙයයි. මේ අනුව ඓතිහාසික භෞතිකවාදය යනු නිෂ්පාදන ක්‍රමවේදය හරහා සමාජය දෙස බැලීමයි. මෙයින් මාක්ස් යෝජනා කරන්නේ එක් සමාජ ඓතිහාසික ක්‍රමයකින් තවත් සමාජ ක්‍රමයක් දක්වා පරිවර්තනය වන්නේ නිෂ්පාදන මාධ්‍යයෙන් වෙනස් වීම හරහා බවය. ජීවිතය වශයෙන් මාක්ස් හඳුනාගන්නේ මිනිසාගේ නිෂ්පාදනය ජීවිතයයි. විඥානයෙන් මෙම ජීවිතය තීන්දු කළ නොහැකි අතර ජීවිතය තුළින් විඥානය තීන්දු වෙයි. ඉතිහාසය පිළිබඳ භෞතිකවාදී අධ්‍යයනය යනු මිනිසාගේ විඥානය මිනිසා හිතන ආකාරය අනුව තේරුම් නොගෙන සත් ජීවනමය පුද්ගලයන් සත්‍ය ලෝකය මත ක්‍රියාත්මක වීමේදී විඥ්ඥාණ ප්‍රකාරයන් නිර්මාණය කරන ආකාරය තේරුම් ගැනීමය. අදහස් රූපයෙන් ලෝකය තේරුම් ගැනීම විඥානවාදයේ ප්‍රවේශයයි. මාක්ස්ට අනුව අදහස් නිර්මාණය වන්නේ භාවිතයෙන්ය. ඒ හරහා වෙනත් ක්‍රමයක් නොමැත. මේ නිසාම මනුෂ්‍ය විමුක්තිය හටගන්නේ මනස තුළ නොවේ. සත්‍ය ලෝකය තුළයි.

මේ අනුව මාක්ස් ඉදිරිපත් කළ භෞතික නිෂ්පාදන ක්‍රියාවලිය මිනිස් ඉතිහාසය පුරාවටම සක්‍රීය පැවත එයි. නිෂ්පාදනයේ සඳහා තුන් ආකාර ප්‍රභවයන් එකිනෙකට සම්බන්ධ විය යුතු බව මාක්ස් දක්වයි. එනම්, ස්වභාවධර්මයේ මූලාශ්‍ර, ශ්‍රමය සහ එම ශ්‍රමය වැය කිරීමට උපකාරී වන උපකරණය. මෙය වෙනත් ආකාරයකට පවසන්නේ නම් නිෂ්පාදන බලවේග, මාධ්‍ය සහ නිෂ්පාදන සම්බන්ධතා එකට එක්වීම මගින් මෙම ක්‍රියාවලිය සිදු වේ. මෙහිදී නිෂ්පාදන බලවේග යනු නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන මූලික සාධකය. නිෂ්පාදන මාධ්‍ය වශයෙන් සළකන්නේ මිනිසාගේ ශ්‍රම ශක්තියද ඇතුළත්ව විවිධ නිෂ්පාදන විධීන් වේ. ඒ අනුව මෙම නිෂ්පාදන ක්‍රියාවලියේ දී මිනිසුන් ඔවුනොවුන් අතර නිශ්චිත සම්බන්ධතාවලට ඇතුළත් වෙති. මේවා නිෂ්පාදන සම්බන්ධතා ලෙස දක්වයි. මාක්ස් පවසන්නේ

මෙහිදී නිෂ්පාදන බලවේග වලට අයත් සියලු කටයුතු සඳහා එනම් නිශ්චිත යන්ත්‍රයක් සොයා ගැනීම, එය නිෂ්පාදනයට යොදාගැනීම, එය වර්ධනය කිරීම හා පාලනය කිරීම ආදිය සඳහා එම නිෂ්පාදන මාධ්‍යයන්හි හිමිකාරිත්වය දරන්නන් යන එම මාධ්‍ය වෙත ශ්‍රමය ය යන කොටස් මගින් ඉහත කී සම්බන්ධතා රාමුව සකස් කරන බවයි. එසේම නිෂ්පාදන සම්බන්ධතා මූලික වශයෙන් නිෂ්පාදන බලවේගවල ප්‍රමාණයෙන් උපදින නමුත් ඒවා නිෂ්පාදන බලවේගවලට සක්‍රියව බලපෑම් කරයි. පන්ති සහිත සමාජයක දී නිෂ්පාදන බලවේග වන භෞතික ශක්තීන් සොයා ගැනෙන්නේත්, භාවිත කරන්නේත්, සංවර්ධනය කරන්නේත්, නිෂ්පාදන බලවේගවල හිමිකාරීත්වය සහිත පන්තිය විසිනි. එසේම තම ශ්‍රම ශක්තිය ඔවුන්ගේ අභිමතය යටතට පත් කිරීමට සිදුව ඇති වැඩකරන පන්තිය අතර සම්බන්ධය, ඒකත්වය සහ අරගලය මෙම නිෂ්පාදන ක්‍රියාවලිය තීව්‍ර කරයි. එක් අතකින් මෙම නිෂ්පාදන සම්බන්ධතා නිෂ්පාදන මාධ්‍යන්ගේ හිමිකම් රටාව සහ බෙදාහැරීමේ රටාව මත ද ආධිපත්‍යය දරයි. ඒ ආකාරයට නිෂ්පාදන ක්‍රියාවලිය නිශ්චිත සමාජ ආර්ථික ක්‍රමයක පදනම සකස් කරයි. කෙසේ වුවද නිෂ්පාදන සම්බන්ධතා නිෂ්පාදන ක්‍රියාවලියෙන් පැන නගින නමුත් නිෂ්පාදන මාධ්‍යවල හිමිකාරිත්වයේ සම්බන්ධතා, නිෂ්පාදන බලවේග සමඟ ඇතිකරගන්නා ප්‍රතිවිරෝධය එතෙක් නිෂ්පාදන බලවේගයන්ගේ හිමිකාරීත්වය තිබූ පන්තියෙන් තවත් පන්තියකට මාරුවේ. එය නැවත අන්තර් ප්‍රතිවිරෝධතා මගින් නව පන්තියකට හිමිකාරිත්වය ලබා දෙයි.

"සංවර්ධනයේ එක්තරා අවධියක, සමාජයේ ද්‍රව්‍යමය නිෂ්පාදන බලවේග පවතින නිෂ්පාදන සබඳතා සමඟ හෝ මෙය හුදෙක් නීතිමය වශයෙන් එකම දෙය ප්‍රකාශ කරයි ඔවුන් මෙතෙක් ක්‍රියාත්මක වූ රාමුව තුළ ඇති දේපල සබඳතා සමඟ ගැටුමකට පැමිණේ. නිෂ්පාදන බලවේගවල වර්ධනයේ ආකාරවලින් මෙම සබඳතා ඔවුන්ගේ විලංගු බවට පත්වේ. ඉන්පසු සමාජ විප්ලවයේ යුගයක් ආරම්භ වේ" (Marx, 1859. A Contribution to the Critique of Political Economy)

මෙතෙක් ඉතිහාසය පුරාවට සිදු වූයේ වූයේ මෙම අනවරත ක්‍රියාවලියයි. මෙය මාක්ස්ගේම වචනවලින් පවසන්නේ නම් 'මෙතෙක් පැවති සියලු සමාජ වල ඉතිහාසය පන්ති අරගල වල ඉතිහාසය යි.'

ඒ අනුව මාක්ස් මානව ඉතිහාසයේ නිෂ්පාදන සබඳතාවල වර්ධනයේ අදියර හතරක් පෙන්වා දෙයි. ප්‍රාථමික කොමියුනිට්ස් සමාජය (සමුපකාර ගෝත්‍රික සමාජවල මෙන්), වහල් සමාජය (ගෝත්‍රික සිට නගර රාජ්‍යයේ වර්ධනයක්; වංශාධිපතිත්වය උපත ලබයි), වැඩවසම් සමාජය (වංශාධිපතියන් පාලක පන්තියයි; වෙළඳුන් ධනපතියන් බවට පරිණාමය වේ), ධනවාදී සමාජය (ධනපතියන් නිර්ධන පංතිය නිර්මාණය කර සේවයේ යොදවන පාලක පන්තියයි) වශයෙනි. ධනවාදයේ දී, මෙය ප්‍රකාශ වන්නේ නිෂ්පාදන මාධ්‍ය පාලනය කරන පාලක පන්තීන් සහ වැටුප් සඳහා ප්‍රතිලාභ වශයෙන් තම ශ්‍රම ශක්තිය විකුණා මෙම මාධ්‍යයන් සක්‍රීය කරන කම්කරු පන්ති (නිර්ධන පංතිය ලෙස හැඳින්වේ) අතර ගැටුමෙනි. මාක්ස් ඓතිහාසික භෞතිකවාදය පුරෝකථනය කළේ, පෙර සමාජ ආර්ථික පද්ධති මෙන්, ධනවාදය අභ්‍යන්තර ආතතීන් ඇති කළ අතර එය ස්වයං විනාශයට තුඩු දෙන අතර නව පද්ධතියක් වන සමාජවාදය මඟින් ප්‍රතිස්ථාපනය කරයි. ධනවාදය යටතේ පන්ති ප්‍රතිවිරෝධතා, එහි අස්ථාවරත්වය සහ අර්බුදකාරී ස්වභාවය හේතුවෙන්, කම්කරු පන්තියේ පන්ති විඥානය වර්ධනයට තුඩු දෙනු ඇත, එය ඔවුන්ගේ දේශපාලන බලය අත්පත් කර ගැනීමට සහ අවසානයේ පන්ති රහිත, කොමියුනිස්ට් සමාජයක් පිහිටුවීමට තුඩු දෙනු ඇත. නිෂ්පාදකයින්ගේ නිදහස් සංගමය, ධනවාදය පෙරලා දැමීමට සහ සමාජ-ආර්ථික විමුක්තිය ගෙන ඒම සඳහා කම්කරු පන්තිය සංවිධානාත්මක විප්ලවවාදී ක්‍රියාමාර්ග ගත යුතු බවට තර්ක කරමින් මාක්ස් එය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරීව බලපෑම් කළේය.

මේ අනුව නිෂ්පාදන සබඳතා මඟින් සමාජ ආර්ථික ක්‍රමයක මූලික පදනම සකස් කරයි. සමාජයේ උත්තර නිර්මිතය ලෙස මාක්ස් හැඳින්වූ දේශපාලනය, සිරිත් විරිත්, සදාචාරයන්, නීතිය, කලාව, දර්ශනය, ආගම, විවිධ දෘෂ්ටිවාද ආදිය රඳා පවතින්නේ මෙම නිෂ්පාදන සම්බන්ධතා රාමුව මත ය. එය මුළුමනින්ම සහ සම්පූර්ණයෙන්ම සමාජ විඥානය නිර්මාණ නොකරතත් සැබැවින්ම එහි ප්‍රධාන කාරකයා වන්නේ නිෂ්පාදන සම්බන්ධතාය. නව පදනමක් බිහි වන විට ඒ සඳහා අනුරූප වන උත්තර නිර්මිතයක් බිහි වෙයි.

A. P. Sheptulin පවසන පරිදි, 'නිෂ්පාදන සබඳතා සමාජයේ ආර්ථික පදනම ලෙස සලකනු ලබන අතර, ඒවා විසින් තීරණය කරනු ලබන අදහස් සහ අනුරූප ආයතන සමාජයේ උපරි ව්‍යුහය ලෙස සලකනු ලැබේ. නමුත් පදනම සමන්විත වන්නේ ඒ කාල සීමාව තුළ ප්‍රමුඛ වන නිෂ්පාදන සම්බන්ධතාවලින් පමණක් නොවේ. වෙනත් නිෂ්පාදන සම්බන්ධතා සමූහයක, විශේෂයෙන්ම පැරණි නිෂ්පාදන මාදිලියේ පැවැත්මක් ලෙස ඉතිරි වූ ඒවා මෙන්ම නව ආර්ථික ව්‍යුහය හා සම්බන්ධ වේ. එය ඉතා සරලව හා පුළුල් ලෙස සමාජයේ අනෙකුත් සියලුම අංශ වෙත යොමු කරයි. එයට සංස්කෘතිය, දෘෂ්ටිවාදය (ලෝක අදහස්, වටිනාකම් සහ විශ්වාසයන්), සම්මතයන් සහ අපේක්ෂාවන්, මිනිසුන් වාසය කරන අනන්‍යතා, සමාජ ආයතන (අධ්‍යාපනය, ආගම, මාධ්‍ය සහ පවුල, වෙනත් අය අතර), දේශපාලන ව්‍යුහය සහ රාජ්‍යය (සමාජය පාලනය කරන දේශපාලන උපකරණ) ඇතුළත්ය. මාක්ස් තර්ක කළේ උපරි ව්‍යුහය පදනමෙන් වර්ධනය වන අතර එය පාලනය කරන පාලක පන්තියේ අවශ්‍යතා පිළිබිඹු කරන බවයි.

කෙසේ වෙතත් පදනම සමාන්තර ලෙස ම උත්තර නිර්මිතයේ පැවැත්මට හේතු නොවේ. නමුත් එහි වෙනස් වීමේ පදනම වන්නේ සමාජයේ ආර්ථික පදනමයි. ව්‍යුහයයි. වෙනත් වචනවලින් කියතොත් නිෂ්පාදන සම්බන්ධතා හා බලවේගවලට අනුකූලවය. ඇත්තෙන්ම උත්තර නිර්මිතය සක්‍රීය වූවකි. එයට සාපේක්ෂ ස්වාධීනත්වයක් තිබේ. යම් නිෂ්පාදන මාදලියක්, පදනමක් වෙනස් කිරීමට හෝ ශක්තිමත් කිරීමට උත්තර නිර්මිතයේ එන කලාව, දර්ශනය, දේශපාලනය, විද්‍යාව හා සදාචාරමය අදහස් බලපානු ලබයි. විශේෂයෙන්ම රජය, දේශපාලන සංවිධාන ආදිය එහිදි තීරණාත්මක ලෙස පදනමට බලපෑම් කරයි. පදනම සහ උපරි ව්‍යුහය අතර සම්බන්ධය පැහැදිලි කිරීමට මාක්ස් විසින් කලාව තෝරා ගන්නා ලදී. ආර්ථික වශයෙන් නොදියුණු සමාජයක ග්‍රීකයන්ගේ චිත්‍ර, වීර කාව්‍ය ඉතා උත්කෘෂ්ට මට්ටමක පැවති අතර එම අසමාන සම්බන්ධය මඟින් මාක්ස් පැහැදිලි කළේ නිෂ්පාදන බලවේගවල ඉහළම වර්ධනය මත විශාලතම කලාත්මක ජයග්‍රහණ රඳා නොපවතින්නටද පුළුවන් බවයි. ආර්ථික පදනම නියතිවාදයක් ලෙස ඇතැම්හු හඳුනාගත්තද මාක්ස් හෝ එංගල්ස් කිසිවිටෙකත් එසේ පවසා නැත. ඒ සඳහා හොඳම උදාහරණය නම් 1890 සැප්තැම්බර් 21 වැනිදා ජේ. බ්ලොග් වෙත එංගල්ස් යවන ලිපියයි.

''...ඉතිහාසයේ භෞතිකවාදී සංකල්පයට අනුව ඉතිහාසය අවසාන වශයෙන් නිර්ණය කරන්නා වූ මූල ධාතුව වනුයේ සැබෑ ජීවිතයේ ජනනය හා ප්‍රජනනයයි. මීට වැඩිදෙයක් මාක්ස් හෝ මා කිසිවිටෙකත් ප්‍රකාශ කර නැත. එහෙයින් යමෙක් මෙය, එහෙයින් යමකු මෙය ආර්ථික මූල ධාතුව එකම නිර්ණායකය යයි කීමට විකෘති කර දක්වන්නේ නම්, ඔහු එම ප්‍රස්තුතය තේරුමක් නැති වියුක්ත අර්ථශූන්‍ය වාග් පාඨයක් බවට පරිවර්තනය කරයි. ආර්ථික තත්ත්වය පදනමයි. එහෙත් උපරි ව්‍යුහයේ බොහෝ අංගද පන්ති අරගලයේ දේශපාලන ස්වරූප සහ එහි ප්‍රතිඵල, නිදසුනක් වශයෙන් සාර්ථක සටනකින් පසුව විජයග්‍රාහී පන්තිය විසින් ස්ථාපිත කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ආදිය අධිකරණ ස්වරූප සහ අරගලවලට සහභාගි වන්නන්ගේ සිත් තුළ මෙම සියලුම සැබෑ අරගලවල ප්‍රතිරූප පවා, දේශපාලන, නෛතික, දාර්ශනික න්‍යායන්, ආගමික මත සහ ආධානග්‍රාහී ක්‍රම බවට ඒවායේ තවදුරටත් සංවර්ධනය වීම ඓතිහාසික අරගලවල ගමන් මග කෙරෙහි සිය බලපෑම ඇති කරන අතර බොහෝ අවස්ථාවලදී ඒවායේ ස්වරූපය නිර්ණය කිරීමේදී විශාලතම බලපෑම් කරයි. මෙම අංග සියල්ලෙහිම අන්තර් ක්‍රියා කාරිත්වයක් සිදුවන අතර එහිදී සියලුම අන්ත අහඹු රාශිය මධ්‍යයෙහි (එනම් සිය අභ්‍යන්තර අන්තර් සම්බන්ධතා කොතරම් දුරස්ථ හෝ ඔප්පු කිරීමට කොතරම් අපහසු ද යත් එය නො පවත්නා සේ නැතිනම් නොවැදගත් සේ අපට සැලකිය හැකි දේවල් සහ සිද්ධීන්වල) ආර්ථික ව්‍යාපාරය අවසානයේදී අවශ්‍ය දේ වශයෙන් තහවුරු වෙයි. එසේ නොමැතිනම් න්‍යාය ඉතිහාසයේ ඕනෑම යුගයකට අදාල කිරීම ඉතා සරල සමීකරණයක් විසඳීමට වඩා පහසු වනු ඇත.'' (Worsley, 1990, 12-17)

මාක්ස්ගේ දාර්ශනික ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡාවේදී දේශපාලන ආර්ථිකය සම්බන්ධ අදහස් අමතක කළ නොහැක. තරුණ මාක්ස් ආර්ථික විද්‍යාවේ (ඔහුගේ ජීවිත කාලයෙන් අඩකට වඩා වැඩි කාලයක්) බොහෝ සේ නියැලී සිටි අතර එය අප දැන් අධ්‍යයනය කරන ආර්ථික විද්‍යාවට වඩා වෙනස්ය. එය හුදෙක් ආර්ථිකය, සමාජය සහ දේශපාලනය පිළිබඳ ඒකාබද්ධ විශ්ලේෂණයකින් සමන්විත දේශපාලන ආර්ථික ඉදිරි දර්ශන පරාසයක් ගැන සාකච්ඡා කරයි. මාක්ස්ගේ අවමංගල්‍ය දිනයේදී එංගල්ස් පැවසුවේ මාක්ස්ගේ

හොඳම සොයාගැනීම් දෙකක් හඳුනාගත හැකි බවයි. එනම් 'අතිරික්ත වටිනාකම' සහ 'ඓතිහාසික භෞතිකවාදී' න්‍යායන්ය. එබැවින්, ඉතිහාසය තුළින්, විශේෂයෙන්ම, ධනේශ්වර නිෂ්පාදන මාදිලිය තුළ ප්‍රාග්ධනය විසින් ශ්‍රමය සූරාකෑම සම්බන්ධ පන්ති අරගලයේ විශ්ලේෂණය තුළින් පන්ති අතර ආර්ථිකය ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කිරීමට මාක්ස් හට අවශ්‍ය විය.

"ඕනෑම මාක්ස්වාදී විශ්ලේෂණයකට මූලික වන්නේ ආර්ථිකය, ප්‍රාග්ධනය ප්‍රතිනිෂ්පාදනය කරන ආකාරය, ලාභදායිත්වය පවත්වා ගෙන යන ආකාරය සහ අර්බුද වර්ධනය වන ආකාරය පිළිබඳ එහි අවබෝධයයි." (Gamble 1999, 140).

එබැවින්, මාක්ස්ගේ දේශපාලන ආර්ථික විද්‍යාව ධනවාදයේ අර්බුදය පිළිබඳ විවිධ විශ්ලේෂණ ගැන සැලකිලිමත් වේ; වැටුප් ශ්‍රමය, පරාරෝපණ ශ්‍රමය, ප්‍රාග්ධනයේ ලාභය, විවිධ වර්ගයේ ආර්ථික පද්ධතිවල අතිරික්ත නිෂ්පාදනයේ භූමිකාව සහ බෙදා හැරීම ඇතුළු ඉඩම් කුලියට දීම සහ අතිරික්ත වටිනාකම, ආර්ථික වටිනාකමේ ස්වභාවය සහ සම්භවය, ආර්ථික වටිනාකමේ ස්වභාවය සහ ආරම්භය, ආර්ථිකය මත පන්ති හා පන්ති අරගලයේ බලපෑම සහ දේශපාලන ක්‍රියාවලීන් සහ ආර්ථික පරිණාමයේ ක්‍රියාවලිය ඒ අතර වෙයි.

පරාරෝපණය පිළිබඳ අදහස මාක්ස් විසින් වර්ධනය කරන්නේ හේගල්ගේ අදහස් හරහාය. හේගල්ගේ 'Phenomenology of Spirit' කෘතිය තුළ දිවෙන කේන්ද්‍රීය අදහසක් වන්නේද පරාරෝපණය පිළිබඳ අදහසයි. කෙසේ නමුත් හේගල් සාකච්ඡා කරන්නේ ස්වයං විඥානයේ පරාරෝපණය හරහා දේවල් බිහිවන බවත් මෙම පරාරෝපණය මේ නිසාම හුදු නිශේධනීය අදහසක් ගම්‍ය නො කරන බවත් ඒ තුළින් ප්‍රතිජානමය බවක් ගම්‍ය කරන බවයි. දේවල් නිර්මාණය වන්නේද පරාරෝපණය නම් සංසිද්ධිය හරහායි. වාස්තවිකත්වය හේගල්ට අනුව ආත්මයෙන් පරිබාහිරව තිබෙන දෙයක් නොව ආත්මයට එළියට යෑමක්ය. මේ අනුව පරමාර්ත්මයේ සත්‍යවාදී ගුණයක් වශයෙන් පරාරෝපණය හඳුනාගත හැක. පරමාත්මයට ප්‍රකාශ විය හැක්කේ වාස්තවික ආකෘති ආකාරයටයි.

යම් කෙනෙකුට හේගල්ගේ මූළුමහත් ප්‍රපංචමය ගම්‍ය පරාරෝපණය සහ පරාරෝපණයෙන් ගැළවෙන්නට කරනු ලබන උත්සාහයක් වශයෙන් අර්ථකථනය කළ හැකිය. මාක්ස් තමන්ගේ ආර්ථික දාර්ශනික අත්පිටපත් ග්‍රන්ථයේදී හේගල් විසින් වර්ධනය කරන පරාරෝපණ අධ්‍යයනයේ ඇති විප්ලවවාදී ගුණයන් මෙන්ම එහි ඇති අඩුපාඩුද පැහැදිලි කරයි. හේගල්ගේ පරාරෝපණය එළියට එන්නේ වස්තුකරණයක් ආකාරයටයි. හේගෙල්ගේ ගැටලුව වාස්තවිකත්වය වන්නේ පරාරෝපණය සහ වස්තු කරනය අතර වෙනස තේරුම් ගැනීමට අපොහොසත් වීමයි. මාක්ස් පවසනුයේ ඕනෑම සමාජ ක්‍රමයක මිනිසුන් නිෂ්පාදන ක්‍රියාවලියක යෙදෙන විට වස්තුකරණයකට ලක් වන බවයි. සෑම විටම මිනිස් ශ්‍රමය ප්‍රකාශයට පත් වන්නේ වස්තුකරණයක් අයුරින්ය. නමුත් පරාරෝපණය මාක්ස්ට අනුව නිශ්චිත සමාජ ක්‍රමයක් තුළ හටගන්නා ප්‍රපංචයකි. ධනේශ්වර ක්‍රමය තුළින් පරාරෝපණය සිදුවන්නේ මාක්ස්ට අනුව සෑම ඓතිහාසික අවධියකම ඊට සුවිශේෂී වූ වස්තුකරණයක් තිබේ. මාක්ස් තමන්ගේ පසුකාලීන කෘති තුළ පරාරෝපණය නම් ක්‍රියාවලිය දේශපාලන ආර්ථික යෙදුම් ආශ්‍රයෙන් පැහැදිලි කිරීමට උත්සාහ ගනියි. මේ අනුව මාක්ස් පැහැදිලි කරන පරාරෝපණය තවදුරටත් හේගල්ගේ මෙන් වියුක්ත සංකල්පයක් නොවේ. මහා පරිමාණ නිෂ්පාදන ක්‍රමය තුළදී සිදුවන අනිවාර්ය ප්‍රතිඵලයකි. හෙගල් තුළ නිතරම පරමාත්මය ස්වයං වස්තුකරණයට ලක් වන අතර ධනේශ්වර නිෂ්පාදන ක්‍රමය තුළ මාක්ස්ට අනුව ආකාර හතරකින් පරාරෝපණය වේ. ඔහුට තමන් නිෂ්පාදනය කරන වස්තුවේ අයිතිය අහිමි වේ. නිෂ්පාදනය තුළ ඔහු අමුතු සත්වයෙක් බවට පත්වේ. එසේම සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියේ කොටසක් පමණක් බවටද ඔහු පත් වේ. මෙහිදී නිෂ්පාදනය වර්ධනය වන විට පොහොසතුන් සහ දුප්පතුන් අතර පවතින පරතරය ක්‍රමානුකූලව වැඩි වීමටද පටන් ගනියි. එවිට තමාගේම ශ්‍රමය තමන්ට හතුරු වස්තුවක් බවට පත්වේ. ඔහුගේ අභ්‍යන්තරික ජීවිතය ඔහුට තවදුරටත් අයිති නැති දෙයක් බවට පත්වේ. සාරයක් නැති ජීවිතයක් බවට පත්වේ. නිෂ්පාදන ක්‍රියාවලිය තුළ කම්කරුවා පරාරෝපණය වීම යනු ඔහුගේ ශ්‍රමය වස්තුවක් බවට පත් වීමක් පමණක් නොව එසේ පත්වන වස්තුව තමන්ට අයිති නැති ස්වායක්ත වස්තුවක් බවටද පත්වේ. එමෙන්ම මෙම වස්තුව ස්වායත්ත බලයක් ලබා නිෂ්පාදනය කළ පුද්ගලයාට එරෙහිව පීඩක බලවේගයක් බවට පත් වේ.

සත්‍ය වශයෙන්ම මිනිසා තම නිෂ්පාදන ක්‍රියාකාරකම තුළ තිරිසන් සතුන්ගෙන් වෙනස් වන්නේ නිෂ්පාදන ජීවිතය පමණක් නිසා නොව සජීවී සමාජයේ පැවැත්ම සඳහා තවත් ඵලදායි ශ්‍රමයක්ද කරන බැවිනි (විෂයගත කිරීම සහ වාස්තවිකකරණය). මාක්ස් තවදුරටත් පවසන්නේ මිනිසාද ස්වභාව ධර්මයේ කොටසක් වන නමුත් අනෙක් සත්ත්වයන්ට වඩා වෙනස් දෙය නම් ඔහු තමාද වෙනස් කර ගන්නා අතරම ස්වභාවධර්මයද වෙනස් කිරීම නිසාය. එවිට ඔහුගේ ඵලදායි ක්‍රියාකාරකම් ඔහුව ස්වභාවධර්මයට සම්බන්ධ කරයි ('මිනිසා ක්‍රියාකාරකම් - සොබාදහම). මෙම නිෂ්පාදන කාර්යයේදී මිනිසාට තම ශ්‍රම ශක්තිය ගෙවිය යුතු අතර එය වැටුප් ශ්‍රමය බවට පත්වේ. එවිට ශ්‍රමයේ ශ්‍රම ශක්තියද වෙළඳ භාණ්ඩයක් බවට පත් වේ. මෙම තත්ත්වය තුළ, ශ්‍රමයට එහි හිමිකම අහිමි වේ. වෙනත් වචනවලින් කිවහොත්, ශ්‍රමයේම නිෂ්පාදනය ඔහුගෙන් වෙන් වී වෙළඳ භාණ්ඩයක් ලෙස ඔහුට එරෙහිව පැමිණේ. එය නැවත නිෂ්පාදනය කිරීමට ඔහුට තවදුරටත් උනන්දුවක් නැත. එනම්, ඔහු තම නිෂ්පාදනයෙන් විසම්බන්ධි වේ. ධනේශ්වර සමාජයක කම්කරුවා යනු මෙවලමක් හෝ වස්තුවක් මිස පුද්ගලයෙකු නොවේ. මාක්ස්ගේ මුල් ලේඛනවලින් එකක් වන 'On James Mill' හි මෙසේ පැහැදිලි කරයි;

"අපි හිතමු අපි මිනිස්සු විදියට නිෂ්පාදනය කළා කියලා. අප සෑම කෙනෙකුම ආකාර දෙකකින් තමා සහ අනෙක් පුද්ගලයා තහවුරු කර ඇත. 1. මගේ නිෂ්පාදනයේ දී මම මගේ පෞද්ගලිකත්වය, එහි නිශ්චිත චරිතය වෛෂයික කර ඇත, එබැවින්, ක්‍රියාකාරකම් අතරතුර මගේ ජීවිතයේ තනි ප්‍රකාශනයක් පමණක් නොව, වස්තුව දෙස බලන විට, මට පුද්ගලික සතුටක් ලැබෙනු ඇත. මගේ පෞරුෂය වෛෂයික බවත්, ඉන්ද්‍රියයන්ට පෙනෙන බවත්, එබැවින් සියලු සැකයෙන් ඔබ්බට බලයක් ඇති බවත් දැන සිටීම. 2. මගේ නිෂ්පාදනයේ ඔබේ රසවින්දනය හෝ භාවිතය තුළ, මගේ කාර්යයෙන් මිනිස් අවශ්‍යතාවයක් තෘප්තිමත් කර ගැනීම, එනම් මිනිසාගේ අත්‍යවශ්‍ය ස්වභාවය වාස්තවික කර ගැනීම සහ එසේ වස්තුවක් නිර්මාණය කිරීම යන දෙකෙහිම සෘජු වින්දනය මට ලැබෙනු ඇත. තවත් මිනිසෙකුගේ අත්‍යවශ්‍ය ස්වභාවයේ අවශ්‍යතාවයට අනුරූප වේ ...අපගේ නිෂ්පාදන අපගේ අත්‍යවශ්‍ය ස්වභාවය පිළිබිඹු කරන බව අප දුටු බොහෝ කැඩපත් වනු ඇත.''(Karl Marx's EPM of 1844, 1959, 29, 30).

මාක්ස්ගේ පරාරෝපණය පිළිබඳ අදහස් සමඟම ඔහුගේ මානවවාදය, ආගම පිළිබඳ විචාරය හොඳින් හඳුනාගත හැකිය. ධනවාදී සමාජයක පුද්ගලයාට මෙන්ම ස්වභාව ධර්මයට සිදුවන සියලු ආකාරයේ තත්ත්වයන් මාක්ස් ගෙනහැර දැක් වූයේ එය එතරම්ම අහිතකර නිසාය. එම නිසා මාක්ස්ගේ දාර්ශනික ව්‍යාපෘතියේ අවසාන වශයෙන් යෝජනා කරන්නේ කොමියුනිස්ට්වාදයයි. එනම්, නිර්ධන පංතියේ මෙම දුක්ඛිත තත්ත්වය මුලිනුපුටා දැමීමට සහ විශ්වීය මානව විමුක්තිය ඉටු කිරීමට ය. එය හදිසි හෝ ස්වයංක්‍රීය චලනයක් නොවේ. ධනේශ්වර සමාජය විසින් තම ශ්‍රමය සූරාකෑම කම්කරු පන්තිය තේරුම් ගන්නා විට සහ ධනවාදයට එරෙහිව එක් වූ විට එය සමාජය තුළ සිදු වේ. මාක්ස් කොමියුනිස්ට්වාදය පිළිබඳ ඔහුගේම අදහස මෙසේ විස්තර කරයි;

"කොමියුනිස්ට්වාදය යනු මනුෂ්‍ය ස්වයං විසබන්ධයක් ලෙස පුද්ගලික දේපල ධනාත්මක අධිප්‍රතිනිර්මාණය කිරීම වන අතර එම නිසා මිනිසා හරහා සහ මිනිසා වෙනුවෙන් මානව සාරය සැබෑ ලෙස අත්පත් කර ගැනීමයි. එය සමාජීය, එනම් මනුෂ්‍ය ජීවියෙකු ලෙස මිනිසා සම්පූර්ණයෙන් ප්‍රතිෂ්ඨාපනය කිරීම, සවිඥ්ඥාණික වූ සහ පෙර සංවර්ධන කාල පරිච්ඡේදවල සමස්ත ධනය තුළ සිදු වන ප්‍රතිෂ්ඨාපනයකි. මෙම කොමියුනිස්ට්වාදය, සම්පූර්ණයෙන් වර්ධනය වූ ස්වභාවිකවාදය ලෙස, මානවවාදයට සමාන වන අතර, සම්පූර්ණයෙන් දියුණු වූ මානවවාදය ලෙස ස්වභාවිකවාදයට සමාන වේ; එය මිනිසා සහ ස්වභාවධර්මය අතර සහ මිනිසා සහ මිනිසා අතර ගැටුමේ සැබෑ විසඳුමයි, පැවැත්ම සහ පැවැත්ම අතර, වාස්තවිකකරණය සහ ස්වයං-තහවුරු කිරීම අතර, නිදහස සහ අවශ්‍යතාවය අතර, පුද්ගලයා සහ විශේෂ අතර ගැටුමේ සැබෑ විසඳුමයි. එය ඉතිහාසයේ ප්‍රහේලිකාවේ විසඳුම වන අතර එයම විසඳුම බව දනී.'' (Karl Marx's EPM of 1844, 1959, 53).

මේ අනුව අප මෙම ලියමන ආරම්භයේ කියූ මාක්ස් වෙතින් නැඟුණු තර්ක බුද්ධියේත් මානව අනුරාගයේත් මාත්‍රාවන් මුසු වූ දේශපාලන ක්‍රියාකාරීත්වය සම්බන්ධ වනුයේ ප්‍රායෝගික ලෙස ලෝකයත් තමාත් වෙනස් කර ගැනීමේ විප්ලයකටය. මාක්ස් සිය ජීවිතයෙන්ම ඔප්පු කරන ලද්දේත් එම ජීවන ව්‍යවහාරයයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Andy Blunden, Karl Marx's Confession, *the International Review of Social History*, 1956.

Bukharin, N.I. *Historical Materialism: A System of Sociology*, New York: penguin, 1921.

Balibar, Etienne. *The Philosophy of Marx*, (trans) Chris Turner, Verso: London,1993'

Karl Marx's *Economic and Philosophical Manuscripts of 1844*, Trans. Martin Milligan, Moscow: Progress Publisher, 1959.

Marx, Karl. *Theses On Feuerbach*. ed. Fredric Engels. Moscow: progress Publisher, 1969.

Marx, Karl and Engels, Friedrich. *The Communist Manifesto*, Norton, 2013.

Marx, Karl. Engels, Friedrich. *The German Ideology*, New York: international publishers, 1958.

Melkonian, Marker. *Marxism*, USA: West-View Press,1996.

Worsley, Peter. *Marx and Marxism*, Ellis Horwood Ltd, 1990.

Wolff, Robert Paul, *Understanding Marx*. Basil Blackwell Publisher, 1985.

The First writings of Karl Marx, (PDF) edited by Paul M. Schafer, 1897.

*මාක්ස් හඳුනා ගනිමු.* (අනු.) ලීලානන්ද ගමාච්චි. මරදාන : විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 2014.

ගම්ලත්, සුචරිත. *මාක්ස්වාදයේ මුල්පොත.* නුගේගොඩ : සංහිඳ මුද්‍රණ සහ ප්‍රකාශන, 2011.

අපනාසියෙව්, වී. ජී. *මාක්ස්වාදී දර්ශනයේ මූලධර්මඃ දයලෙක්තික භෞතිකවාදය.* (පරි.) දූදිගම වී. රුදිගු. රාජගිරියඃ කුරුලු පොත්, වර්ෂයක් සඳහන්නොවේ.

*කාල් මාක්ස්: ඔහු කවුද? අපි කවුද?*, ශ්‍රී ලංකා පෙරටුගාමී පක්ෂය, 2018.